# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1721/2 - 2011 අගෝස්තු 29 වැනි සඳුදා - 2011.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/79.

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 1 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය තහනම් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. රට තුළ සාමය අඛණ්ඩව පවත්වාගෙන යෑම තහවුරු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් සද්භාවයෙන් දරන ලද ප්‍රයත්නයන් වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් "ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය" යන නාමයෙන් සහ අභිධානයෙන් හඳුන්වනු ලබන සංවිධානය මෙයින් තහනම් කරනු ලැබේ.

3. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතදී, කිසිම තැනැත්තෙකු විසින්, ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය යනුවෙන් හඳුන්වනු ලබන සංවිධානයේ හෝ එම සංවිධානය නියෝජනය කරන හෝ එම සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරනු ලබන වෙනත් යම් සංවිධානයක හෝ එවැනි ක්‍රියාකාරකම්වලට සම්බන්ධිත හෝ සලකනු ලබන හෝ සම්බන්ධ බවට සාධාරණ ලෙස සැක කරනු ලබන යම් සංවිධානයක :–

(අ) සාමාජිකයෙකු හෝ සමූහයක සාමාජිකයෙකු වීම ;

(ආ) නායකත්වය සැපයීම ;

(ඇ) නිල ඇඳුම්, ඇඳුම්, සංකේත, ලාංඡන හෝ ධජ පැළඳීම, ප්‍රදර්ශනය කිරීම, එසවීම හෝ සන්තකයේ තබා ගැනීම ;

(ඈ) රැස්වීමක් කැඳවීම, රැස් කිරීම, පැවැත්වීම හෝ සහභාගිවීම ;

1A - G 14602— 840 (2011/08)

(ඉ) සාමාජිකත්වය ලබා ගැනීම හෝ සම්බන්ධවීම ;

(ඊ) සාමාජිකයකුට හෝ සමූහයකට හෝ එහි වෙනත් යම් ආශ්‍රිතයකුට රැකවරණය සැලසීම, ඔහු සඟවා තබා ගැනීම, ඔහුට ආධාර කිරීම ;

(උ) එය ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම, සහාය දැක්වීම, උපදෙස් ලබාදීම, ආධාර කිරීම හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම ;

(ඌ) එහි යම් ක්‍රියාකාරකමක් හෝ සිද්ධියක් සංවිධානය කිරීම හෝ ඊට සහභාගීවීම ;

(එ) මුදල් හෝ ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම හෝ මුදල් හෝ ද්‍රව්‍ය වලින් දායකවීම ;

(ඒ) ඒ සඳහා හෝ එහි ද්‍රව්‍ය ප්‍රසම්පාදනය, ගබඩා කිරීම ;

(ඔ) සහාය වීම හෝ නියෝජනය කිරීම ;

(ඕ) යම් කටයුත්තක නිරත වීම ; හෝ

(ක) ඒ වෙනුවෙන් තොරතුරු පතුරුවා හැරීමට සැලැස්වීම

නොකළ යුතු ය.

4. මෙම නියෝග වල 3 වැනි නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹ දී පවත්වනු ලබන්නා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් එසේ වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් වන්නේ ය.

5. මෙම නියෝග වල 3 වැනි නියෝගය උල්ලංඝනය කරමින් වරදක් සිදු කිරීම සඳහා යම් ක්‍රියාකාරකමක් සිදු කිරීම, ඒ සඳහා තැත් කිරීම, අනුබලදීම, යෙදී සිටීම සඳහා කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹ දී පවත්වනු ලබන්නා වූද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් එසේ වරදකරු කරනු ලැබීමේදී, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් වන්නේ ය.

6. යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ නියෝග යටතේ වරදක් සිදුකරනු ලබන අවස්ථාවක දී, එම වරද සිදු කිරීම පිළිබඳ ඍජුවම වගකියනු ලැබිය යුතු තැනැත්තන්ට අමතරව –

(i) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ ප්‍රධාන විධායක නිලධරයා ;

(ii) එම පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම සහ ප්‍රධාන විධායක නිලධරයා ; සහ

(iii) එම පුද්ගල මණ්ඩලය වෙළඳ ආයතනයක් නොවන සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් නම්, එකී පුද්ගල මණ්ඩලයේ කණ්ඩායමේ හෝ සංවිධානයේ නායකයා සහ එම මණ්ඩලයේ කළමනාකරණය සඳහා වගකිව යුතු සෑම නිලධරයකුම ;

එම පුද්ගල මණ්ඩලයට අතිරේකව, එකී වරදට වරදකරු වන බවට සලකනු ලැබිය යුතු ය.

7. (1) නියමිත සංවිධානයේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ භාරයේ පවතින මුදල්, සුරැකුම් හෝ බැරකම් භාවිත කරනු ලබන බවට හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන බවට යෝග්‍යයැයි අදහස් කරනු ලබන යම් විමර්ශනයකින් පසුව ජනාධිපතිවරයා විසින් සෑහීමට පත්වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ලිඛිත නියෝගයක් මගින් එම තැනැත්තාගේ භාරයේ එවැනි මුදල්, සුරැකුම් සහ බැරකම් ඇති බවට එම නියමය කිරීමෙන් පසුව එම තැනැත්තාගේ භාරයට පත්වන යම් මුදල් සුරැකුම් සහ එම සංවිධානයට අයත් නිශ්චල හෝ චංචල දේපල රාජසන්තක කළ යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වැනි ඡේදය යටතේ වූ ජනාධිපතිවරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

8. සැක දුරු කිරීමේ කාර්යය සඳහා මානුෂීය ආධාර සැපයීම හා සම්බන්ධිත යම් ක්‍රියාකාරකමක යෙදී සිටීම සඳහා ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කලින් කල ලිඛිත නියමයකින් නිශ්චිතව දක්වනු ලබන සහ ශ්‍රී ලංකා රජය සමග යම් ගිවිසුමකට එළඹී සිටින යම් ජාත්‍යන්තර සංවිධානයක අයිතිවාසිකම් වලට මෙම නියෝග වල විධිවිධාන කිසිම ආකාරයකින් බලනොපාන බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එල්.ඩී.බී. 11/79.

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 2 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (දෙමළ පුනරුත්ථාපන සංවිධානය තහනම් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මහජන ආරක්ෂාව සහතික කිරීමේ, මහජන සාමය ආරක්ෂා කිරීමේ සහ නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා " දෙමළ පුනරුත්ථාපන සංවිධානය" යන අභිධානය යටතේ වූ සංවිධානය මෙයින් තහනම් කරනු ලැබේ.

3. මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව :–

(අ) (මෙහි මින්මතු "තහනම් සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) "දෙමළ පුනරුත්ථාපන සංවිධානය" නම් වූ සංවිධානය සමග යම් සම්බන්ධතාවක් හෝ එම සංවිධානයේ සාමාජිකත්වය හෝ ඊට බැඳී සිටීමක් පෙන්නුම් කරන හෝ නිරූපණය කරන යම් නිල ඇඳුමක්, ඇඳුමක්, සංකේතයක් හෝ වෙනත් ලාංඡනයක් පළඳින ; හෝ

(ආ) ඉහත කී තහනම් කළ සංවිධානයේ යම් රැස්වීමක් කැඳවන හෝ ඊට සහභාගී වන හෝ එකී තහනම් සංවිධානයේ යම් කටයුත්තකට හෝ ඊට සම්බන්ධ හෝ අදාළ හෝ යම් කටයුත්තකට සහභාගී වන හෝ නියැලෙන ; හෝ

(ඇ) එකී තහනම් සංවිධානයේ සාමාජිකයන් ලෙස තැනැත්තන් බඳවා ගැනීමට යම් තැනැත්තන්ට ආරාධනය කිරීමෙන් හෝ බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් හෝ අරමුදල්වලින් දායකවීමෙන් හෝ අරමුදල් එකතු කිරීමෙන් හෝ එකී තහනම් සංවිධානයට තොරතුරු සැපයීමෙන් හෝ වෙනත් යම් සහායක් ලබාදීමෙන් එකී තහනම් සංවිධානයට උපකාර කරන ; හෝ

(ඈ) ඒ සංවිධානයේ සාමාජිකයෙකු අල්ලා ගැනීම, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් කිරීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ අනිසි ලෙස මැදිහත්වීමේ අරමුණ ඇතිව එකී සාමාජිකයාට රැකවරණය සපයන, ඔහු සඟවා තබා ගන්නා හෝ වෙනත් යම් ආකාරයකින් ඔහුට සහාය දක්වන ; හෝ

(ඉ) ඒ තහනම් කළ සංවිධානය විසින් හෝ ඒ සංවිධානය වෙනුවෙන් හෝ ඒ සංවිධානයේ යම් සාමාජිකයෙකු විසින් පළ කරනු ලබන හෝ පළ කරන ලදැයි උද්දේශිත යම් ලිඛිත හෝ මුද්‍රිත දෙයක් සකස් කරන, මුද්‍රණය කරන, බෙදාහරින හෝ ප්‍රකාශයට පත් කරන හෝ එසේ සකස්කිරීමට, මුද්‍රණය කිරීමට, බෙදාහැරීමට හෝ ප්‍රකාශයට පත් කිරීමට කවර හෝ ආකාරයකින් සම්බන්ධ වන හෝ එවැන්නක් සලකා බලන ; හෝ

(ඊ) එකී තහනම් කළ සංවිධානයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා එකී තහනම් කළ සංවිධානය හෝ එහි සාමාජිකයෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නියමයක්, තීරණයක් හෝ ප්‍රකාශනයක් හෝ උපදේශයක් නැතහොත් ඒ සංවිධානයට අදාළ යම් තොරතුරක් කවර හෝ ආකාරයකින් වෙනත් තැනැත්තෙකුට සන්නිවේදනය කරන හෝ සන්නිවේදනය කිරීමට උත්සාහ කරන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේදී අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට ඔහු යටත් විය යුතු ය.

4. මෙම නියෝග වල 3 වැනි නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹදී පවත්වනු ලබන්නා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග වැනි ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් එසේ වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් වන්නේ ය.

5. මෙම නියෝග වල 3 වැනි නියෝගය උල්ලංඝනය කරමින් වරදක් සිදු කිරීම සඳහා යම් ක්‍රියාකාරකමක් සිදු කිරීම, ඒ සඳහා තැත් කිරීම, අනුබලදීම, යෙදී සිටීම සඳහා කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොළඹදී පවත්වනු ලබන්නා වූද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වැනි ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලද බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් එසේ වරදකරු කරනු ලැබීමේදී, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් වන්නේ ය.

6. (1) නියමිත සංවිධානයේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ භාරයේ පවතින මුදල්, සුරැකුම් හෝ බැරකම් භාවිත කරනු ලබන බවට හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන බවට යෝග්‍යයැයි අදහස් කරනු ලබන යම් විමර්ශනයකින් පසුව ජනාධිපතිවරයා විසින් සෑහීමට පත්වන අවස්ථාවකදී, ජනාධිපතිවරයා විසින් ලිඛිත නියෝගයක් මගින් එම තැනැත්තාගේ භාරයේ එවැනි මුදල්, සුරැකුම් සහ බැරකම් ඇති බවට හෝ එම නියමය කිරීමෙන් පසුව එම තැනැත්තාගේ භාරයට පත්වන යම් මුදල්, සුරැකුම් හෝ බැරකම් සහ එම සංවිධානයට අයත් නිශ්චල හෝ චංචල දේපල රාජසන්තක කළ යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) (1) වැනි ඡේදය යටතේ වූ ජනාධිපතිවරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතුය.

7. සැක දුරු කිරීමේ කාර්යය සඳහා මානුෂීය ආධාර සැපයීම හා සම්බන්ධිත යම් ක්‍රියාකාරකමක යෙදී සිටීම සඳහා ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කලින් කල ලිඛිත නියමයකින් නිශ්චිතව දක්වනු ලබන සහ ශ්‍රී ලංකා රජය සමග යම් ගිවිසුමකට එළඹී සිටින යම් ජාත්‍යන්තර සංවිධානයක අයිතිවාසිකම් වලට මෙම නියෝග වල විධිවිධාන කිසිම ආකාරයකින් බලනොපාන බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.